# 10 වාක්‍ය නිර්මාණය

මීට ඉහත පාඩම්වල දී නාම පද හා ක්‍රියා පද ගැනත් ඒවායේ වර්ග කිරීම් ගැනත් හැදෑරුවෙමු. දැන් නාම පද හා ක්‍රියා පද භාවිත කොට වාක්‍ය නිර්මාණය කරමු.

ළමයා පැළයක් සිටුවයි.

* මෙහි 'සිටුවයි' යන ආඛ්‍යාතයෙන් සිටුවන්නේ කවුරුද යන ප්‍රශ්නය මතු වෙයි. පිළිතුර වන්නේ 'ළමයා' යන්නයි.

  එය වාක්‍යයේ 'උක්තය'යි.

* සිටුවන්නේ මොනවා ද යන්න ඊ ළඟට මතු වන ප්‍රශ්නයයි.

  එයට පිළිතුර වන්නේ 'පැළැටියක්' යන්නයි.

  එය වාක්‍යයේ කර්මයයි.

  ළමයා කරන්නේ කුමක් ද යන ප්‍රශ්නය මතු කරන්න. එයට පිළිතුර වන්නේ 'සිටුවයි' යන්න ය. එය ළමයා කරන ක්‍රියාවයි. වාක්‍යය සම්පූර්ණ වන්නේ මේ ක්‍රියාව යෙදීමෙනි. ක්‍රියාව සහිත කොටස 'ආඛ්‍යාතය'යි.

* මේ අනුව සරල වාක්‍යයක;

  1. උක්තය 2. කර්මය 3. ක්‍රියාව

යනුවෙන් ප්‍රධාන කොටස් තුනකි.

| ළමයා | පැළයක් | සිටුවයි |
|---|---|---|
| ↓ | ↓ | ↓ |
| උක්තය | කර්මය | ක්‍රියාව |

* කර්මයක් නොමැතිව ද අර්ථ පූර්ණ වාක්‍ය පවතී.
  උදාහරණ:- සඳ පායයි
  මල් පිපෙයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

වාක්‍ය නිර්මාණයේ දී සම්මත රටා පවතී. එවැනි රටා කීපයක් හඳුනා ගනිමු.

1. උක්තය ප්‍රාණවාචී ඒක වචන නම් ආඛ්‍යාතය ද ඒක වචන වෙයි.

ගොවියා කුඹුර කොටයි.

2. උක්තය අප්‍රාණවාචී බහු වචන නම් ආඛ්‍යාතය ද බහු වචන වෙයි.

ගොවියෝ කුඹුර කොටති.

3. උක්තය අප්‍රාණවාචී ඒක වචන වුවත් බහු වචන වුවත් ආඛ්‍යාතය ඒක වචන වෙයි.

ගස සුළඟට සෙලවෙයි.
ගස් සුළඟට සෙලවෙයි

4. උක්තයේ පුරුෂය අනුව ආඛ්‍යාතය ද එම පුරුෂයෙන් ම යෙදෙයි. පහත සටහනෙන් ඒක වචන, බහු වචන භේදය අනුව පුරුෂ තුනෙහි වාක්‍ය නිර්මාණය වන ආකාරය හඳුනා ගත හැකි ය.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම පාඩම් කරමි | අපි පාඩම් කරමු |
| මධ්‍යම පුරුෂ | ඔබ පාඩම් කරති/කරහි<br>තෝ පාඩම් කරහි<br>යුෂ්මතා පාඩම් කරහි | ඔබ පාඩම් කරති<br>තොපි පාඩම් කරහු<br>යුෂ්මත්හු පාඩම් කරහු |
| ප්‍රථම පුරුෂ | ඔහු පාඩම් කරයි<br>ශිෂ්‍යයා පාඩම් කරයි<br>ශිෂ්‍යාව පාඩම් කරයි | ඔවුහු පාඩම් කරති<br>ශිෂ්‍යයෝ පාඩම් කරති<br>ශිෂ්‍යාවෝ පාඩම් කරති |

* අතීත හා අනතීත යන කාල අනුව ද වාක්‍ය නිර්මාණය සකස් විය හැකි ය.

ශිෂ්‍යයා පොත පාඩම් කරයි./ කරන්නේ ය. (අනතීත කාල)
ශිෂ්‍යයා පොත පාඩම් කෙළේ ය. (අතීත කාල)

## ලිඛිත අභ්‍යාස

1. ගැළපෙන උක්ත පද හිස් තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. .................................. පාසලට යන්නෙමි. (මම/ මා)

ii. .................................. ගුරුන් නමදිමු. (අප/ අපි)

iii. .................................. නැටුම් බලන්නට යන්නෙහු. (තොපි/ තොප)

iv. .................................. අහසේ පියාසර කරති. (කුරුල්ලෝ/ කුරුල්ලන්)

v. .................................. රෝගීන් රැක බලා ගනිති. (හෙදියන්/ හෙදියෝ)

2. සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ඔවුහු වනයට .................................. (පිවිසියහ/ පිවිසියේ ය.)

ii. මව දරුවන් .................................. (රකින්නී ය/ රැක්කෝ ය.)

iii. ගංගා මුහුදට ගලා .................................. (බසී/ බසින්නෝ ය.)

iv. බොහෝ සිවුපා සත්තු වනයේ ................. (සැරිසරති/ සැරිසැරුවේ ය.)

v. සංචාරකයෝ පෙරහැර ................................ (නැරඹූහ/ නැරඹුවේ ය.)

3. පහත දැක්වෙන අනතීත කාල වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. මම පුවත්පත කියවමි.

ii. ඔබ ගමට යන්නහි.

iii. මිනිස්සු ශ්‍රමදානයට සහභාගි වෙති.

iv. කුරුල්ලෝ කැදලි කරා පියාඹන්නෝ ය.

v. ශිෂ්‍යයෝ පුස්තකාලයට යති.